C
371

# 'ගැටවර වියේ ග්‍රාමීය පාසැල් ළමුන් ගේ මානසික අවශ්‍යතා' පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයකි.

ඩී. ඇම්. ජයතිස්ස., බී.ඒ. අධ්‍ය. ඩිප්(සම්මාන)

අධ්‍යාපන ශාස්ත්‍රපති පරීක්ෂණයේ අර්ධ පූර්ණයක් වශයෙන් පේරාදෙණිය

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට

ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයයි.

1981

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

364071

නිබන්ධන උපදේශක:-

ආචාර්ය මොහොට්ටිගේ උපාලි සේදර (එම්.ඒ., පී.එච්.ඩී.)

අධ්‍යාපන පීඨය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,

පේරාදෙණිය.

## සාරාංශය

'ගැටවර විය' කායික වශයෙන් හා මානසික වශයෙන් ද, වෙනස් කම් සිදුවෙන අවධියක් වශයෙන් සැලකේ. මේ හේතුව නිසාම ගැටවර විය මනෝවිද්‍යා ඥයන්ගේ දැඩි සැලකිල්ලට ලක්වූ අවධියක් වශයෙන් ගැනේ. මනෝ විශ්ලේෂණ වාදීන් ප්‍රජානන වාදීන්, සමාජ මනෝ විද්‍යාඥයන් ,චර්යා වාදීන් හා ජීව විද්‍යාත්මක මත ධරින් වශයෙන් සැලකෙන සෑම මනෝ විද්‍යා මත ධරියෙක්ම ගැටවර විය කෙරේ අවධානය යොමුකර ඇත.

ගැටවර විය සම්බන්ධයෙන් සලකනු ලැබූ කල ගැටවර අවශ්‍යතා පිළිබඳව අවධානය නොදක්වා ඒ පිළිබඳව සාර්ථක අධ්‍යනයන් කල නොහැකිය. මනෝ විද්‍යාඥයින් කායික අවශ්‍යතා හා මානසික අවශ්‍යතා පිළිබඳ අර්ථනිරූපනයන් දැක්වීමට උත්සාහ කලද, ගැටවර විය සුවිශේෂීකරණය කිරීමට මානසික අවශ්‍යතා කවරේදැයි හඳුනාගැනීමට කරන ලද අධ්‍යනයන් ඉතා අල්ප වේ.

ගැටවර අවධිය කායික වෙනස් කම් සිදුවෙන අවධියකි. ගැටවර වියෙහි සිදුවන මෙම කායික වෙනස් කම් ගැටවර අවශ්‍යතා කෙරේ බලපාන බව සැලකීමට තුඩුදිය හැකි කරුණු බොහෝ වේ.ශරීරය තුල රසායනික වෙනස්කම් සිදුවීමත් එතෙක් නොලැබුණ කායික ශක්තියක් ගැටව ර ගැටවරියනට හිමිවීමත් නිසා ඔවුන් තුල නව අවශ්‍යතා ජනිත වේ. තවද, එතෙක් තිබුණු අවශ්‍යතා ගත නව නැඹුරුවක් ඇතිවේ.

ශ්‍රී ලංකාවේ ගැටවර "විය පිළිබඳව මෙතෙක් කරන ලද අධ්‍යනයන් ඉතා අල්ප වේ.එවැනි අධ්‍යනයන් අල්පවීම නිසා අප විසින් කරනු ලබන් නේ වෙනත් රටක පර්යේෂණයන් සම්බන්ධ අර්ථ නිරූපනයන් ආශ්‍රිතව අපේ තොරතුරු විග්‍රහ කිරීමය.සමාජ හා ආර්ථික වශයෙන් ද, අපේ රටවලට වඩා බටහිර රටවල් තුල වෙනස් කම් පවතින බැවින්, එම රටවල මානසික අවශ්‍යතා,අපේ රටෙහි ගැටවර මානසික අවශ්‍යතා අතර වෙනස් කම් පිළිබිඹු"විය හැක.

මෙම අධ්‍යනයෙන් බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති ග්‍රාමීය ගැටවරයන් ගේ අවශ්‍යතා හා ඒ අවශ්‍යතා කෙරෙහි බලපාන පුද්ගලයන් කවරේ ද යන්න අනාවරණය කිරීමය. ග්‍රාමීය ආර්ථික හා සමාජ තත්වය නගර වල ආර්ථික හා සමාජ තත්වයට වඩා වෙනස් වේ. ග්‍රාමීය හා නාගරික වශයෙන් සමාජ ක්‍රම දෙකක් පවතින නිසා ග්‍රාමීය ගැටවරයන් ගේ අවශ්‍යතා ආශ්‍රිත වෙනස්කම් පිළිබිඹු විය හැක.

මහනුවර දිස්ත්‍රික්කයේ තෝරා ගනු ලැබූ ග්‍රාමීය පාසැල් කිහිපයක ගැටවර ගැටවරියන් ආශ්‍රයෙන් කරන ලද මෙම පර්යේෂණය සඳහා අවු 14,15, 16,17, යන වයස් තල වල 320 නියැදියක් යොදා ගැනින. තවද, විවිධ අධ්‍යනයන් ආශ්‍රයෙන් හඳුනා ගන්නා ලද, මානසික අවශ්‍යතා හයක් වටා මෙම අධ්‍යනය කරන ලදී. බුද්ධිමත් දර්ශණයක අවශ්‍යතාවය, නිදහස ලබාගැනීමේ අවශ්‍යතාවය, ආදරය ලබා ගැනීමේ අවශ්‍යතාවය, පිළිගැනීමේ අවශ්‍යතාවය, ලිංගික තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවය, සහ ආරක්ෂාව ලබාගැනී මේ අවශ්‍යතාවය, එම හඳුනා ගත් අවශ්‍යතා වේ. අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා, යුග්ම සැසඳුම් ක්‍රමය හා සජු ක්‍රමය වශයෙන් ප්‍රවේශ දෙකක් ද, අවශ්‍යතා කෙරෙහි බලපාන පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා යුග්ම සැසඳුම් ක්‍රමයද, භාවිතයට ගැනින.

අවශ්‍යතා වටා දෙනු ලැබූ ප්‍රතිචාරයන්, සහසම්බන්ධතාවයන් හා වෙසෙසියාවන් පරීක්ෂාකිරීමෙනී සංඛ්‍යාත්මක විශ්ලේෂණයකට භාජනය කර අවශ්‍යතාවයන් ගේ අනුපිළිවෙල වටහා ගන්නා ලදී. ඒ ඒ අවශ්‍යතා සම්බන්ධයෙන් බලපෑම් කරනු ලබන පුද්ගලයන් සම්බන්ධයෙන් දෙන ලද ප්‍රතිචාරයන් තරා විශ්ලේෂණයකට භාජනය කරන ලද අතර, ස්පියර්මන් ගේ තරා සහසම්බන්ධතා සංගුණකය යොදා ගනිමින් එහි සහසම්බන්ධතාවය ගණනය කරන ලදී. තව දුරටත් ප්‍රතිඵල පිළිබඳ අර්ථකථනයන් කිරීම සඳහා කෙන්ඩල් ගේ වෙසෙසියාව පිළිබඳ සංගුණකයන් ද භාවිතයට ගන්නා ලදී.

මෙම අධ්‍යනයේ දී යොදාගත් නියැදිය, අවු. 14,15,16,17, යන වයස් තල ගතවද, ගැහැණු හා පිරිමි වශයෙන් ද, ගැටවරයන් ගේ සියාම වයස් තල සමස්ථයක් වශයෙන් ද, ගැටවරියන් ගේ වයස් තල එලෙසම සමස්ථයන් වශයෙන් සැලකීමෙන් ද, සම්පූර්ණ නියැදියම සමස්ථයක් කොට සැලකීමෙන්ද, ප්‍රතිඵල විශ්ලේෂනයට ලක්කෙරේ.

එම විශ්ලේෂණයෙන් ලත් ප්‍රතිඵල මෙසේ කැටි කොට දැක්විය හැකිය.

1. ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් මෙන්ම පිරිමි ළමුන් ද, ඉදිරිපත් කරන ලද අවශ්‍යතා හය අතුරින් 'බුද්ධිමත් දර්ශනයක්' ඇති කර ගැනීමේ අවශ්‍යතාව ප්‍රථම අවශ්‍යතාව ලෙස දක්වා ඇත. ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් මෙන්ම පිරිමි ළමුන් ද, සිය දෙවැනි අවශ්‍යතාව ලෙස පොදු වශයෙන් තෝරා ගෙන ඇත්තේ ආදර අවශ්‍යතාවය වේ. තෙවන අවශ්‍යතාවය ලෙස ගැහැණු ළමුන් දක්වා ඇත්තේ 'පිළිගැනීමේ අවශ්‍යතාවය' වන අතර පිරිමි ළමුන් පිළිගැනීමට පවරා ඇත්තේ පස්වන ස්ථානය වේ. ආරක්ෂාව පිරිමි ළමුන් තෙවන ස්ථානයට දක්වන අතර ගැහැණු ළමුන් එයට පවරා ඇත්තේ පස්වන ස්ථානය වේ. 'නිදහස' පිළිබඳ අවශ්‍යතාව ගැහැණු හා පිරිමි දෙපක්ෂයම සිවුවන ස්ථානයට දමා ඇති අතර ලිංගික තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවය අඩුම වරණය ලද අවශ්‍යතාවය වේ.

2. ග්‍රාමීය ගැටවර ගැහැණු ළමුන් 'පිළිගැනීම' පිරිමි ළමුන්ට වඩා අවශ්‍යතාවයක් කොට සලකන අතර පිරිමි ළමුන් 'ආරක්ෂාව' ගැහැණු ළමුන්ට වඩා අවශ්‍යතාවයක් ලෙස සලකා ඇත. ගැහැණු ළමුන් 'නිදහස'ට වඩා අඩු තරාවක් 'ආරක්ෂාව'ට දී ඇති අතර, පිරිමි ළමුන් පිළිගැනීමට වඩා වැඩි වටිනාකමක් ආරක්ෂාවටත්, නිදහසටත් දී ඇත.

3. ග්‍රාමීය ගැටවරයන් ගේ පරීක්ෂාවට ලක් වූ වයස්කල හතර අනුව අවු. 15 දී ගැහැණු ළමුන් ගේ අවශ්‍යතා පිළිබඳ වරණයේ වෙනස්කම් සිදුවන බව පැහැදිලි වන අතර, පිරිමි ළමුන් තුළ අවු. 16 දී අවශ්‍යතා පිළිබඳ වරණයේ වෙනස්කම් හටගන්නා බව පැහැදි පැහැදිලි වේ.

4. ග්‍රාමීය ගැටවර ගැහැණු හා පිරිමි ළමුන් ගේ අවු. 14 – 17 දක්වා වයස්කල අතර කැපී පෙනෙන ප්‍රභේදනයක් ගැටවර අවශ්‍යතා පිළිබඳ වරණයන් හී දක්නට නොලැබේ.

5. ග්‍රාමීය ගැටවර ගැහැණු හා පිරිමි ළමුන් ගේ අවශ්‍යතා පිළිබඳ වරණයන් අතර වැඩි එකඟතාවයක් පෙනෙනුයේ ගැහැණු ළමුන් ගේ වයස් කලයකට ඉහළ පිරිමි ළමුන් ගේ

වයස්තල සමඟ ය. එනම්, ගැහැණු ළමුන් ගේ වයස අවු. 15 ළමුන්, අවු.16 පිරිමි ළමුන් හා වැඩි එත්තතාවක් දැක්වීම අඩු ලෙස ය. එහෙත් වයසින් වැඩෙත්ම (අවු. 16 හෝ 17) මට්ටමේ දී ගැහැණු හා පිරිමි ළමුන් අතර අවශ්‍යතා පිළිබඳ වරගයන් ගේ එත්තතාව වැඩිය.

6. හුදෙක් එක් අවුරුදු වයස් තලයක් තවත් අවුරුද්දක වයස් තලයක් හා සැසඳීම වෙනුවට ආසන්න වයස් තල දෙකක් (14/15 වැනි) එකට ලා තවත් එවැනි වයස්තල දෙකක් (16/17 වැනි) හා සැසඳූ විට ගැටවර අවශ්‍යතා අතර වෙනස්කම් වඩා වෙසෙසි වෙනස්කම් දක්නට ලැබේ.

7. ග්‍රාමීය ගැටවර ගැහැණු හා පිරිමි ළමුන් ගේ, ආරක්ෂාව, ආදරය, පිළිගැනීම, හා නිදහස යන ග්‍රාමීය ගැටවර අවශ්‍යතා කෙරේ වෙසෙසි ලෙස බලපානු ලබනුයේ ගැටවරයා හිමි පවුලේ සාමාජිකයන් වන මව, පියා, හා සොහොයුරු සොහොයුරියන් ය. එහි ලා බාහිර පුද්ගලයන් ගේ බලපෑම වෙසෙසි ලෙස අඩු ය.

8. ලිංගික තොරතුරු හා බුද්ධිමත් දර්ශනය කෙරේ බලපාන පුද්ගලයන් සැලකීමේ දී ගැහැණු හා පිරිමි ළමුන් කෙරේ බලපාන පුද්ගලයන් අතර වෙසෙසි වෙනස්කම් දිටිය හැක. බුද්ධිමත් දර්ශනයක් සඳහා 'ගුරුවරයා ' පමණක් ගැහැණු හා පිරිමි දෙපක්ෂයම ප්‍රධාන බලපෑම කරන්නා ලෙස හඳුනා ගෙන ඇත.

9. විශේෂ වශයෙන් ලිංගික තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාව කෙරේද; දෙවනුව බුද්ධිමත් දර්ශනය කෙරේද පවුලේ සාමාජිකයනට වඩා පවුලෙන් බැහැර පුද්ගලයන් ගේ බලපෑම් වැඩි බැව් පැහැදිලි වේ.

10. ගැහැණු හා පිරිමි ළමුන් කෙරේ පොදුවේ මව, වඩාත්ම බලපෑම් කරන පුද්ගලයා වන අතර දෙපක්ෂයේම අවශ්‍යතා කෙරෙහි පියා බලපානුයේ දෙවන පුද්ගලයා වශයෙනි.

11. ගැහැණු ළමුනට වඩා පිරිමි ළමුන් කෙරෙහි ඇතින් ගේ බලපෑම පොදුවේ වැඩි වශයෙන් දිටිය හැක.

12. නිදහස පිළිබඳ හැරුණ කොට ගුරුවරයා ගේ බලපෑම ගැහැණු ළමයි කෙරෙහි වැඩි වශයෙන් දිටිය හැක.